| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 8 ශ්‍රේණිය | **සිංහල භාෂාව හා සාහිත්‍යය** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

උපදෙස්

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසට අමුණා පිළිතුරු පත්‍රය භාර දෙන්න.

**I කොටස**

- **පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. විභාගයෙන් උසස් ලෙස සමත් වී ඇති බව දැනගත් ඔහුගේ **හිසේ මලක් පිපුණා** වැනි විය.
   1) හිස ගිනිගත්තා සේ වීම
   2) මහත් සතුටට පත්වීම
   3) අධික කෝපයට පත්වීම
   4) හිසේ බරක් තැබුවා වැනි වීම

2. අසාධාරණ ලෙස බලය පතුරවමින් ජීවත් වූ ඔහුගේ **පොරකටු ගෙවිලා** යැයි සමහරු කියති.
   1) වඩාත් බලවත් වී
   2) ආඩම්බර වී
   3) නව පණක් ලැබී
   4) බලය පිරිහී ගොස්

3. "පිහිටක් පතා ගිය තැනින් විපතක් සිදුවීම" යන අදහස සඳහා යෙදිය හැකි ප්‍රස්තාව පිරුළ තෝරන්න.
   1) වඳින්න ගිය දේවාලය හිසේ කඩන් වැටුණා වගේ
   2) අඟේ ඉඳන් කන කනවා වගේ
   3) ගහෙන් වැටුණ මිනිහට ගොනා ඇන්නා වගේ
   4) හොරාගෙ අම්මගෙන් පේන ඇහුවා වගේ

4. පහත සඳහන් වාක්‍යයේ ඇති මහප්‍රාණ අක්ෂර ගණන වන්නේ,
   **තරග ප්‍රතිඵල නිකුත් වෙද්දී ජයග්‍රහණය කළ පිරිස ප්‍රීතිඝෝෂා පැවැත්වූහ.**
   1) එකකි
   2) දෙකකි
   3) පහකි
   4) හතකි

5. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.
   1) ශිෂ්ටාචාරය
   2) කණිෂ්ඨ
   3) විශ්මය
   4) පරිඝණකය

6. නිවැරදි අකාරාදී පිළිවෙළට නම් යෙදී ඇති පිළිතුර තෝරන්න.

1) මාතර, හලාවත, අම්පාර, ගම්පහ
2) බල්ලා, මුගටියා, නරියා, රිලවා
3) ගයාන්, ජනක, විදුර, ශාන්ත
4) ජපානය, ඉන්දියාව, චීනය, මාලදිවයින

7. පහත සඳහන් වාක්‍යයේ ඇති නාම විශේෂණ පදය හා ක්‍රියා විශේෂණ පදය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.

**මුහුදු වෙරළට පැමිණෙන පුංචි ළමයි සරුංගල් යවමින් සතුටින් කෑ ගසති.**

1) වෙරළට , සරුංගල්
2) ළමයි , කෑගසති
3) පුංචි , සතුටින්
4) පැමිණෙන , යවමින්

8. පහත සඳහන් පාඨ අතරින් විධි ක්‍රියාවක් හා ආශිර්වාද ක්‍රියාවක් සහිත පිළිතුර තෝරන්න.

A. අයන්න කියන්න ලොවටම ඇහෙන්න
B. මැනලද පුතේ කිරි දුන්නේ මං නුඹට
C. ඉලපත ගෙන ඇය ගෙය අතුගාන විට
D. කැලේ තිබෙන කොයි දේවත් රස වේවා

1) A හා D
2) B හා C
3) C හා D
4) A හා C

9. යුගල පදයක් නොවන පදය ඇතුළත් පිළිතුර තෝරන්න.

1) ඔප්පු - තිරප්පු
2) යාන - වාහන
3) වතු - පිටි
4) කසළ - බඳුන්

- **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරා යටින් ඉරක් අඳින්න.**

10. ……………….. මුහුදු වෙරළේ සිප්පි කටු ඇහිදිති.

1) සිගිත්තා
2) සිඟිත්තන්
3) සිඟිත්තෙක්
4) සිඟිත්තෝ

11. රබීන්ද්‍රනාත් තාගෝර් නොබෙල් ත්‍යාග දිනා ………………..

1) ගත්හ
2) ගත්තේය
3) ගත්තාය
4) ගත්තෝය

12. "දිය" යන පදයට යෙදිය හැකි බහුඅර්ථ පද ඇතුළත් පිළිතුර තෝරන්න.

1) කාලය, බලය, ශිල්පය
2) නායක, නාගස, නාගයා
3) ජලය, ලණුව, ලෝකය
4) කොඩිය, උතුම්, චන්ද්‍රයා

13. ගුණ නාම පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1) මිනිස්, පක්ෂි, පියුම්
2) ගංගා, කඳු, පැන්සල්
3) ලියුම්, බලන, කියමන්
4) මහත, සියුම්, අවංක

14. මගෙ සුරතල් අක්කාගේ
මාලේ මුතු ඇට වාගේ
මේ වැටෙන්නෙ පිනි බින්දුත්
හදමු එකක් ඒ වාගේ

මෙම කවියෙහි සඳහන් උපමාවක් ලියන්න.

1) සුරතල් අක්කාගේ
2) මුතුඇට වාගේ
3) පිනි බින්දුත්
4) මගෙ සුරතල්

15. "අවුරුදු සිහිනය" කෙටි කතාවේ කතුවරයා වන්නේ,

1) ගුණදාස අමරසේකර මහතා
2) කුමාරතුංග මුනිදාස මහතා
3) ලීල් ගුණසේකර මහතා
4) මාර්ටින් වික්‍රමසිංහ මහතා

16. "**දැදුරු**" යන පදයෙහි ඇති පිල්ලම් අනුපිළිවෙළින් නම් කර ඇති පිළිතුර තෝරන්න.

1) කෙටි ඇදය, කෙටි ඇදය, කෙටි පාපිල්ල
2) කෙටි ඇදය, කෙටි පාපිල්ල, කෙටි ඇදය
3) කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල, කෙටි ඇදය
4) කෙටි ඇදය, කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල

17. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන්ගේ නිර්මාණයක් වන්නේ,

1) රතු රෝස මල
2) නිදහසේ දැහැන
3) ජීවන සුවඳ
4) පෙත්සම

18. ජනකතාවක දක්නට ලැබෙන ලක්ෂණයක් නොවන්නේ,

1) කටින් කට පැවත ඒමයි
2) ජනයා අතරම නිර්මාණය වීමයි
3) නිශ්චිත කතුවරයෙකු විසින් රචනා කර තිබීමයි
4) සරල ගැමි වහර භාවිතයයි

19. ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

1) ගායිකාව මිහිරි ගීයක් ගැයුවාය
2) ක්‍රීඩකයෝ දක්ෂ ලෙස ක්‍රීඩා කළේය
3) ඔවුහු වේදිකා නාට්‍යයක් නරඹයි
4) සේවකයා හොඳින් වැඩ කිරීමට වෙහෙස වූහ

20. පහත සඳහන් චාරිත්‍ර අතරින් සිංහල අලුත් අවුරුද්ද හා සම්බන්ධතාවයක් නොදක්වන චාරිත්‍රය තෝරන්න.

1) නව සඳ බැලීම
2) කප් සිටුවීම
3) ගනුදෙනු කිරීම
4) නොනගතය

(ල.$2 \times 20 = 40$)

## II කොටස

- **පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

1. ඇගයීමක් වශයෙන් ඔබට ලබා දුන් 'දේශාභිමානී ගී ඇසුරින් පොත් පිංචක් නිර්මාණය කිරීම' යන ක්‍රියාකාරකම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    i. ඔබ සකස් කළ පොත් පිංචට යෙදූ නම කුමක්ද? (ල. 2)

    ii. එම පොත් පිංච නිර්මාණය සඳහා යොදාගත් අමුද්‍රව්‍ය 02ක් නම් කරන්න. (ල. 2)

    iii. මෙම පොත් පිංච නිර්මාණය කිරීමට තොරතුරු සොයා ගත් ආකාර දෙකක් ලියන්න. (ල. 2)

    iv. මෙම නිර්මාණය සිදු කිරීමට පෙර ඔබගේ ගුරුතුමා / ගුරුතුමිය ලබා දුන් උපදෙසක් ලියා දක්වන්න. (ල. 2)

    v. මෙම පොත් පිංච නිර්මාණයේදී ඔබ මුහුණ දුන් ගැටලු 2ක් ලියන්න. (ල. 4)

    vi. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමෙන් ඔබ ලද අත්දැකීම් 2ක් ලියන්න. (ල. 4)

    (ල. 16)

2. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

    i. සිංහල අලුත් අවුරුද්ද ඇවිත්

    ii. පරිසරය පණ මෙන් රැක ගනිමු

    iii. මා දුටු රිය අනතුර

    iv. සුන්දර ලක්මව සුරකිමු

    (ල. 14)

3. මේ දිනවල පැතිර යන ඩෙංගු රෝගයෙන් ආරක්ෂා වීම සඳහා අවශ්‍ය දැනුවත් කිරීම් ඇතුළත් කර ඔබගේ ප්‍රදේශයේ තරුණ සංවිධානය මගින් සකස් කර බෙදාහරින අත් පත්‍රිකාවක් සකස් කරන්න.

    (ල. 10)

4. පහත සඳහන් ගද්‍ය පද්‍ය කොටස් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

    i. "උඹේ මේ කෙහෙල්මල් හවරිය හින්දා මගේ හේනෙ කුඹුරෙ වැඩත් පාළු වුණා."

    (අ) මෙම ප්‍රකාශය කළේ කවුද?

    (ආ) මෙය කීවේ කාටද?

    (ඇ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද? (ල. 3)

    ii. "මට නිකන් කියන්න බෑ. ඔය අතේ තියෙන සල්ලිවලින් ශත දහයක් දීලා බොත්තමක් ගන්න ඕන."

    (අ) මෙසේ බොත්තමක් ගන්න යැයි කියන්නේ කාටද?

    (ආ) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද?

    (ඇ) එම පාඩමට අදාළ කෙටි කතාවේ කතුවරයා කවුද? (ල. 3)

iii. සමන්පිච්ච මල් ඉහිරුණු
නිල් තණකොළ පිට්ටනියක්
………………………………
………………………………
(අ) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවිය ඇතුළත් කවි පන්තියේ නම කුමක්ද?
(ඇ) මෙම කවිය ඇතුළත් කවි පන්තියේ රචකයා කවුරුන්ද? (ල. 4)

(මුළු ලකුණු. 10)

5. පහත සඳහන් වාක්‍යවලට සුදුසු අතීතකාල ආඛ්‍යාත පදය යොදා සම්පූර්ණ කරන්න.

i. මිනිස්සු වෙහෙස වී වැඩ …………….
ii. ජනාධිපතිතුමා විදේශ සංචාරයකට …………….
iii. සරුංගල් ඇත අහසේ …………….
iv. ගුරුතුමිය උදෑසන පාසලට …………….
v. මගේ මිතුරා මට තෑග්ගක් …………….
vi. නාහිමියෝ දහම් …………….
vii. කාන්තාවක් තම දරුවා …………….
viii. කම්කරුවෝ වැඩ වර්ජනයට …………….
ix. අපි මුහුදු වෙරළෙහි සෙල්ලම් …………….
x. කුරුල්ලා අහසේ …………….

(ල. 10)

6.

i. පහත සඳහන් පදවල නාමය (ප්‍රකෘතිය) හා තද්ධිත ප්‍රත්‍යය වෙන් කර ලියන්න.
(අ) දේශීය (ආ) ඥානවන්ත

ii. පහත සඳහන් ප්‍රකාශවලට සුදුසු සමාස නාමය ලියන්න.
(අ) කිරෙන් පිසූ බත් - ……… (ආ) ඉර ද හඳ ද තරු ද - ……

iii. පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවල හිස්තැනට යෝග්‍ය පද යොදා සම්පූර්ණ කරන්න.
(අ) පාළු ගෙයි ……………. (ආ) …………….වනේ වාසේ

iv. පහත සඳහන් බහුවර්ථ පද යොදා අර්ථවත් වාක්‍ය බැගින් නිර්මාණය කරන්න.
(අ) තිර (ආ) දළ

v. 'ළමයි අලංකාර වෙරළ තීරයේ සෙල්ලම් කරති' යන වාක්‍යයෙහි නාම විශේෂණ හා විශේෂ්‍ය පද වෙන් කරන්න.
(අ) නාම විශේෂණය- ……… (ආ) විශේෂ්‍යය- …………….

(ල.$2 \times 5 = 10$)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පරිසරය යනු අප අවට වටපිටාවයි. මිනිසුන්, සතුන් වගේම ගස්වැල්, කඳුවැටි, ගංගා, වනාන්තර ආදිය ද පරිසරයේ අංග වේ. මේවා මගින් පරිසරයට එක් කරන්නේ අපමණ වටිනාකමකි. ගස්වැල් මගින් ආහාර, සෙවණ ලබා දෙන අතර ජලය ජීවීන්ගේ පැවැත්මට අත්‍යවශ්‍යම සාධකයක් වේ. මිනිසා උපන් මොහොතේ සිට ගන්නා හුස්ම පොද මිය යන තෙක්ම ලබා දෙන්නේ වාතය මගිනි. නමුත් මිනිසා විසින් තම වාසිය පිළිබඳව පමණක් ම සිදු කරනු ලබන ජලයට අපවිත්‍ර එක් කිරීම, වන විනාශය, අහිතකර වායු වායුගෝලයට මුදාහැරීම වැනි අයුතු ක්‍රියා නිසා පරිසර පද්ධතියට දැඩි සේ හානි සිදු වේ. සියැටෙල් නම් රතු ඉන්දියානු නායකයා ප්‍රකාශ කර ඇත්තේ 'ඔබ ගසක් සිටුවයි නම් ඔබ මවකට සමානය. ඔබ ගසක් කපයි නම් ඔබ මිනීමරුවෙකුට සමානය' යනුවෙනි. මෙම ප්‍රකාශය තුළින්ම ගස්වැල් ඇතුළු පරිසරය රැකගැනීම වටිනාකම අපට හොඳින්ම පැහැදිලි වේ.

i. මෙම ඡේදයට අනුව පරිසරයට අදාළ අංග 2ක් නම්කරන්න.
ii. මිනිසා විසින් පරිසරයට සිදුකරන අයුතු ක්‍රියා 2ක් ඡේදයෙන් සොයා ලියන්න.
iii. පරිසරය රැක ගැනීම පිළිබඳ ප්‍රකාශයක් සිදු කර ඇති මෙම ඡේදයේ සඳහන් රතු ඉන්දියානු නායකයා කවුද?
iv. මෙහි සඳහන් ආකාරයට ගසක් සිටුවන පුද්ගලයා සමාන කර ඇත්තේ කාටද?
v. පහත සඳහන් පදවලට විරුද්ධ පද ඡේදයෙන් සොයා ලියන්න.

(අ) පමණ -  ආ) හිතකර -

(ල.$2 \times 5 = 10$)